# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2160/29 – 2020 ජනවාරි 29 වැනි බදාදා – 2020.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ කිරිවැල්දොළ (අ.ග.පි. 125) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක MA/KTP/2019/444 හා 2019.10.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මානික්කවත්ත – ප්‍රමාණය: හෙක්. 16.7474

උතුරට: සිංහරාජ රක්ෂිතය සහ ඒ. ඩී. දළුවත්ත ලැන්ඩ් එස්ටේට් (පුද්.) සමාගම හිමිකම් කියන මාණික්කවත්ත ඉඩම; නැගෙනහිරට: ඒ. ඩී. දළුවත්ත ලැන්ඩ් එස්ටේට් (පුද්.) සමාගම හිමිකම් කියන මාණික්කවත්ත ඉඩම සහ එස්. පී. අමරවීර හිමිකම් කියන බෙවරලියවත්ත; දකුණට: එස්. පී. අමරවීර හිමිකම් කියන බෙවරලියවත්ත සහ සිංහරාජ රක්ෂිතය; බටහිරට: සිංහරාජ රක්ෂිතය.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/3/2019/FR/202.
2020 ජනවාරි මස 23 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 219

1A – G 31906 – 21 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*